# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2019 අංක 21 දරන මුදල් පනත

---

[සහතිකය සටහන් කළේ 2019 ඔක්තෝබර් මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2019 නොවැම්බර් මස 01 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 12.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2019 අංක 21 දරන මුදල් පනත**

[සහතිකය සටහන් කළේ 2019 ඔක්තෝබර් මස 31 වන දින]

එල්.ඩී.—ඕ. 15/2019

**2018 අංක 35 දරන මුදල් පනත සංශෝධනය කිරීම පිණිස ද; විදේශීය වාණිජ ගනුදෙනු අය බද්දක් පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2019 අංක 21 දරන මුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

I වන කොටස

**2018 අංක 35 දරන මුදල් පනතේ VII වන කොටස සංශෝධනය කිරීම**

2. 2018 අංක 35 දරන මුදල් පනතේ 23 වන වගන්තිය එහි "නිශ්චිතව සඳහන් කරන ලද මෝටර් වාහනය" යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 2018 අංක 35 දරන පනතේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

" "නිශ්චිතව සඳහන් කරන ලද මෝටර් වාහනය" යන්නෙන්-

(අ) පළමු ලියාපදිංචිය 2019 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව, එළඹෙන වාහනයකට අදාළව, එකලස් කරන ලද හෝ එකලස් නොකරන ලද සිලින්ඩර් ධාරිතාව 2300 සී.සී. ඉක්මවන ඩීසල් මෝටර් වාහනයක් හෝ සිලින්ඩර් ධාරිතාව 1800 සී.සී. ඉක්මවන පෙට්‍රල් මෝටර් වාහනයක් හෝ එන්ජිමෙහි බලය කි.වො. 200 ඉක්මවන විදුලි බලයෙන් ක්‍රියාකරන වාහනයක් අදහස් වේ. නමුත් සිලින්ඩර් ධාරිතාව 2200 සී.සී. නොඉක්මවන ද්විත්ව කාර්ය පෙට්‍රල් මෝටර් වාහනයක්, ද්විත්ව කාර්ය විදුලි බලයෙන් ක්‍රියාකරන මෝටර් වාහනයක්, වෑන් රථයක්, තනි කැබ් රථයක් හෝ වැගන් රථයක් ඊට ඇතුළත් නොවිය යුතු ය;

(ආ) පළමු ලියාපදිංචිය 2019 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පසුව, එළඹෙන වාහනයකට අදාළව, යම් එකලස් කරන ලද හෝ එකලස් නොකරන ලද මෝටර් වාහනයක් අදහස් වේ. නමුත් වෑන් රථයක්, තනි කැබ් රථයක්, ද්විත්ව කැබ් රථයක්, යතුරු පැදියක්, මෝටර් ට්‍රයිසිකලයක්, ගිලන් මෝටර් රථයක්, අවමංගල මෝටර් රථයක්, ලොරි රථයක්, ට්‍රැක්ටරයක්, අත් ට්‍රැක්ටරයක්, ට්‍රේලරයක් හෝ (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත ප්‍රකාරව සපයනු ලබන, සුසංගත භාණ්ඩ විස්තරය සහ කේතකරණ අංක ක්‍රමය යටතේ හඳුනාගන්නා ලද භාණ්ඩ ප්‍රවාහනය සඳහා වන යම් මෝටර් වාහනයක් ඇතුළත් නොවේ.".

## II වන කොටස

## 2018 අංක 35 දරන මුදල් පනතේ XI වන කොටස සංශෝධනය කිරීම

2018 අංක 35 දරන පනතේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** (මේ කොටසේ මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2018 අංක 35 දරන මුදල් පනතේ 40 වන වගන්තිය එහි (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) (මේ කොටසේ මින් මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) "කාබන් බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් 2019 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2019 නොවැම්බර් මස 30 වන දිනයෙන් අවසන් වන කාල සීමාව සඳහා මෙහි තුන්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන සෑම මෝටර් වාහනයක ම ලියාපදිංචි අයිතිකරුගෙන්, එම උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති අනුප්‍රමාණවලින් අය කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මෙම උපවගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත ප්‍රකාරව, 2019 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2019 නොවැම්බර් මස 30 වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ පළමුවරට ලියාපදිංචි කරන මෝටර් වාහන සම්බන්ධයෙන් අය කරනු නොලැබිය යුතු ය.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) 40 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද යම් අදාළ මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු විසින් වාර්ෂික ලියාපදිංචිය අලුත් කළ යුතු දිනයේ දී හෝ එදිනට පෙර, ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.".

III වන කොටස

**2018 අංක 35 දරන මුදල් පනතේ XII වන කොටස සංශෝධනය කිරීම**

**5.** 2018 අංක 35 දරන මුදල් පනතේ 46 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

2018 අංක 35 දරන පනතේ 46 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"පැහැර හරින ලද අයබද්ද අයකර ගැනීම.

46. (1) අය බද්ද හෝ එයින් යම් කොටසක් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති විට, ගෙවීම පැහැරහැර ඇති අය බද්දේ ප්‍රමාණයට අමතරව, බදු පැහැරහරින්නා විසින්-

(අ) 44 වන වගන්තිය යටතේ අය බද්ද ගෙවිය යුතු දිනයට පසුව එළඹෙන මාසයක් හෝ ඉන් කොටසක කාලසීමාවක් සඳහා පැහැරහැර ඇති එකී අය බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක අනුප්‍රමාණයකින් ; සහ

(ආ) (අ) ඡේදයේ නිශ්චිතව සඳහන් කරන ලද ගෙවීම කළ යුතු දිනයට පසුව එළඹෙන මාසයක හෝ ඉන් කොටසක කාලසීමාවක් සඳහා පැහැරහැර ඇති එකී අය බද්දේ ප්‍රමාණයෙන් සියයට දෙකක අනුප්‍රමාණයකින්,

ගණනය කරන ලද අධිභාරයක් කොමිෂන් සභාව වෙත ගෙවීමට යටත් විය යුතු අතර, කොමිෂන් සභාව විසින් ඒ අධිභාරය එකතු කරනු ලැබිය යුතු ය.

(2) මාස තුනකට වඩා වැඩි කාලසීමාවක් සඳහා ගෙවීම පැහැරහැර ඇති යම් අය බද්දක්, ඒ මත උපචිත වූ අධිභාරය ද සමඟ අයකර ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් මෙහි මින් මතු නිශ්චිතව දක්වා ඇති ආකාරයට ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු ය.

(3) දැන්වීම නිකුත් කළ දින සිට සති තුනක කාල සීමාවක් තුළ අය බද්ද සහ ඒ මත අධිභාරය ගෙවනු ලබන්නේ නම් මිස, මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ගෙවීම පැහැරහැර ඇති අය බද්ද සහ ඒ මත උපචිත වූ අධිභාරයේ මුදල් ප්‍රමාණය අයකර ගැනීම සඳහා නඩු කටයුතු ආරම්භ කිරීමට කොමිෂන් සභාව අදහස් කරන බව බදු පැහැරහරින්නා වෙත දැනුම් දෙන දැන්වීමක්, බදු පැහැරහරින්නා වෙත නිකුත් කිරීමට කොමිෂන් සභාව විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය ප්‍රකාරව බදු පැහැරහරින්නා වෙත කොමිෂන් සභාව විසින් දැන්වීමක් නිකුත් කළ නමුත් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් සති තුනක කාලසීමාව ගත වී ඇති වුව ද, ගෙවීම පැහැරහැර ඇති අය බදු මුදල එයින් උපචිත වූ අධිභාරය ද සමඟ ගෙවනු නොලැබ පවතින විට දී, කොමිෂන් සභාව විසින්, සභාපතිවරයාගේ අත්සන යටතේ, බදු පැහැරහරින්නාගේ නම සහ ලිපිනය සහ එසේ නම් කළ තැනැත්තා මේ වගන්තිය මඟින් නියම කර ඇති පරිදි ගෙවීම සිදු කිරීම පැහැරහැර ඇති බව දක්වන ප්‍රකාශයක් සමඟ ගෙවීම පැහැරහැර ඇති මුළු මුදල් ප්‍රමාණය අඩංගු සහතිකයක් බදු පැහැරහරින්නා පදිංචි හෝ ඔහු ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබන අධිකරණ කොට්ඨාසයේ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත නිකුත් කළ යුතු ය. බදු පැහැරහරින්නා සංස්ථාපිත මණ්ඩලයක්, වෙළෙඳ ව්‍යාපාරයක් හෝ වෙළෙඳ ව්‍යාපාරයක් නොවන සංස්ථාපිත නොකළ පුද්ගල මණ්ඩලයක් වන අවස්ථාවක දී, අදාළ සහතිකයේ, එම සංස්ථාපිත මණ්ඩලයේ කළමනාකරණය සහ පාලනය කෙරෙහි වගකීමක් ඇති සෑම අධ්‍යක්ෂවරයකුගේ ම සහ නිලධරයකුගේ ම හෝ එම වෙළෙඳ ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකුගේ ම හෝ එම සංස්ථාපිත නොකළ පුද්ගල මණ්ඩලයේ කළමනාකරණය සහ පාලනය කෙරෙහි වගකීමක් ඇති සෑම නිලධරයකුගේ ම නම් ඇතුළත් විය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක් ලැබීමෙන් පසු, මහෙස්ත්‍රාත්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයක තමා ඉදිරියේ පෙනී සිටීමට සහ එකී සහතිකයේ නිශ්චිතව දක්වන ලද මුදල බදු පැහැරහරින්නාගෙන් අයකර නොගත යුත්තේ මන්ද යන්නට හේතු දක්වන ලෙස නියම කරමින්, එම බදු පැහැරහරින්නා වෙත සිතාසි නිකුත් කළ යුතු ය. දක්වන ලද හේතුව නොගෙවීම සඳහා වූ හේතුව පැහැදිලි කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව මහෙස්ත්‍රාත්වරයාට පෙනී යන අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ බව සටහන් කර ගැනීමෙන් පසුව, එකී සහතිකයේ නිශ්චිතව දක්වන ලද මුදල මහෙස්ත්‍රාත්වරයා විසින් පනවන ලද දඩයක් සේ සලකා බදු පැහැරහරින්නාගෙන් අයකර ගැනීම සඳහා ආඥා කරනු ලැබිය යුතු ය. එසේ අයකර ගනු ලැබූ මුදල් කොමිෂන් සභාව වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාව විසින් ඒ මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.''.

## IV වන කොටස

### විදේශීය වාණිජ ගනුදෙනු මත අය බද්දක් පැනවීම

**6.** (1) මේ පනතේ මේ කොටස, *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ කොටසේ මින් මතු ''නියමිත දිනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

මේ කොටස ක්‍රියාත්මක වන දිනය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන නියමය, *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට මාස තුනක් ඉකුත්වීමට පෙර අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අනුමත කිරීම කරනු ලබන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

**7.** (1) ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකුගෙන් යම් භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සිටින එම තැනැත්තා සමඟ ගෙවීම් කාඩ්පතක් හරහා ගනුදෙනුවක් සම්පූර්ණ කරන ලද සෑම තැනැත්තකුගෙන් ම නියමිත දිනයේ පටන් සහ ඉන් පසුව (මේ කොටසේ මින් මතු ''අය බද්ද'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''විදේශීය වාණිජ ගනුදෙනු මත අය බද්ද'' යනුවෙන් හඳුන්වනු ලබන අය බද්දක් අය කරනු ලැබිය යුතු ය.

විදේශීය වාණිජ ගනුදෙනු සම්බන්ධයෙන් අය බද්දක් පැනවීම.

(2) (1) වන උපවගන්තිය යටතේ වන යම් ගනුදෙනුවක් සඳහා වන අය බද්දේ අනුප්‍රමාණය ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කරනු ලැබූ මුදල මත සියයට 3.5 ක් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් ගනුදෙනුවක් සඳහා වන අය බද්ද ශ්‍රී ලංකාවෙන් පිටතට මුදල ප්‍රේෂණය කරනු ලබන අවස්ථාවේ දී, එවැනි යම් මුදලක් යවනු ලබන සෑම මූල්‍ය ආයතනයක් විසින් ම එකතු කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ යම් මාසයක් තුළ යම් මූල්‍ය ආයතනයක් විසින් එසේ එකතු කරන ලද මුළු මුදල අදාළ මාසයෙන් පසුව එළඹෙන මාසයේ විසිවන දින හෝ ඊට පෙර කොමසාරිස්-ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(5) මූල්‍ය ආයතනයක් විසින්, එම මූල්‍ය ආයතනයේ එක් එක් මුදල් වර්ෂය සම්බන්ධයෙන්, කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකෘතියකින්, යම් ආකාරයකින් හා යම් ඇමුණුම් සමඟ තොරතුරු අඩංගු වාර්තාවක්, ඒ මුදල් වර්ෂය අවසානයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත කොමසාරිස්-ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(6) මේ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට සහ අය බද්ද එකතු කිරීමට අවශ්‍ය විය හැකි විධිවිධාන මේ පනත යටතේ සාදනු ලබන නියෝග මඟින් නියම කරනු ලැබිය යුතු ය.

අය බද්ද ගෙවීමෙන් නිදහස් කිරීම.

**8.** අමාත්‍යවරයා විසින්, රටේ ආර්ථික සංවර්ධනය සැලකිල්ලට ගනිමින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මඟින්, එකී නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, 7 වන වගන්තියේ විධිවිධාන අදාළ කර ගැනීමෙන්, එකී නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් ගනුදෙනුවක්, නිදහස් කරනු ලැබිය හැකි ය.

අය බද්ද ගෙවීම පැහැර හැරීම.

**9.** (1) මේ කොටස යටතේ අය බද්ද ගෙවීමට යටත් යම් මූල්‍ය ආයතනයක් 7 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි අය බද්ද ගෙවීම පැහැරහරින අවස්ථාවක දී, එකී මූල්‍ය ආයතනය මේ පනත යටතේ බදු පැහැරහරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) එවැනි යම් බදු පැහැරහරින්නකුට සහ ඔහු සම්බන්ධයෙන් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ IX වන පරිච්ඡේදයේ, XI වන පරිච්ඡේදයේ, XII වන පරිච්ඡේදයේ, XIII වන පරිච්ඡේදයේ, XIV වන පරිච්ඡේදයේ, XV වන පරිච්ඡේදයේ, XVI වන පරිච්ඡේදයේ, XVII වන පරිච්ඡේදයේ සහ XVIII වන පරිච්ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, අදාළ විය යුතු ය.

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසේ- අර්ථ නිරූපණය.

"කොමසාරිස්-ජනරාල්වරයා" යන්නෙන්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ පත් කරන ලද හෝ පත් කරන ලදැයි සලකනු ලබන දේශීය ආදායම් කොමසාරිස්-ජනරාල්වරයා අදහස් වේ;

"අයභාර කාඩ්පත" යන්නෙන්, කාඩ්පත දරන්නා වෙත එය නිකුත් කරන්නා විසින් ප්‍රදානය කරන ලද ණය පහසුකමක් සහිත, කාඩ්පත දරන්නා විසින් භාවිත කරන ලද ණය මුදල තවදුරටත් දීර්ඝ කිරීමකින් තොරව නියම කරන ලද දිනට හෝ ඊට පෙර ගෙවා නිම කළ යුතු ගෙවීම් කාඩ්පතක් අදහස් වේ;

"ණය කාඩ්පත" යන්නෙන්, කාඩ්පත දරන්නා වෙත එය නිකුත් කරන්නා විසින් ප්‍රදානය කරන ලද ණය පහසුකමක් සහිත, කාඩ්පත දරන්නා විසින් භාවිත කරන ලද ණය මුදල සම්පූර්ණයෙන් හෝ කොටසක් නියමිත දින හෝ ඊට පෙර ගෙවා නිමකළ හැකි කාඩ්පතක් අදහස් වේ. නියමිත දිනට නොපියවන ලද ණය මුදලට නිකුත් කරන්නා විසින් පොළී හෝ වෙනත් ගාස්තු අය කරනු ලැබිය හැකි ය;

"හර කාඩ්පත" යන්නෙන්, මුදල් ලබා ගැනීම හෝ භාණ්ඩ හා සේවා මිල දී ගැනීම සඳහා ගෙවීම් කිරීමට හෝ එම කාර්ය දෙක සඳහා ම හෝ කාඩ්පත දරන්නාගේ ගිණුම ඍජුව ම හර කිරීමෙන් භාවිත කරනු ලැබිය හැකි ගෙවීම් කාඩ්පතක් අදහස් වේ;

"මුදල් සමාගම" යන්නෙන්, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මුදල් සමාගමක් අදහස් වේ;

"මූල්‍ය ආයතනය" යන්නෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ ගෙවීම් කාඩ්පතක් නිකුත් කරන්නකු වශයෙන් හෝ ගෙවීම් කාඩ්පත්වල මූල්‍ය අත්පත්කරු වශයෙන් ව්‍යාපාරයේ නිරත වන බලපත්‍රලාභී වාණිජ බැංකුවක්, බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් හෝ මුදල් සමාගමක් අදහස් වේ;

“මූල්‍ය අත්පත්කරු” යන්නෙන්, ගෙවීම් මාධ්‍යයක් වශයෙන් කාඩ්පත් දරන්නන්ගෙන් ගෙවීම් කාඩ්පත් භාර ගැනීමට තුන්වන පාර්ශ්වයන් සමඟ කටයුතු පිළියෙල කරනු ලබන සහ කාඩ්පත දරන්නා විසින් මිලදී ගත් භාණ්ඩ හා සේවාවල වටිනාකම එම තුන්වන පාර්ශ්වයන් වෙත ප්‍රතිපූරණය කරනු ලබන හෝ කාඩ්පත් දරන්නන් විසින් ලබාගත් මුදල් අත්තිකාරම්වල වටිනාකම එම තුන්වන පාර්ශ්වය වෙත ප්‍රතිපූරණය කරනු ලබන හෝ එම දෙයාකාරයෙන් ම කටයුතු කරනු ලබන යම් තැනැත්තෙක් අදහස් වේ;

“නිකුත් කරන්නා” යන්නෙන්, ගෙවීම් කාඩ්පතක් නිකුත් කරනු ලබන සහ ඒ අනුව කාඩ්පත් හිමියා සමඟ ගිවිසුම්ගත සබඳතාවකට ඇතුළත් වන අස්ථිත්වයක් අදහස් වේ;

“බලපත්‍රලාභී වාණිජ බැංකුව” යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් අදහස් වේ;

“බලපත්‍රලාභී විශේෂිත බැංකුව” යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් අදහස් වේ;

“ගෙවීම් කාඩ්පත” යන්නෙන්, හර කාඩ්පතක්, ණය කාඩ්පතක්, අයභාර කාඩ්පතක් හෝ අගය රාශිගත කාඩ්පතක් අදහස් වේ;

“තැනැත්තා” යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතෙහි තැනැත්තා යන යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

“අගය රාශිගත කාඩ්පත” යන්නෙන්, ගෙවීම් මාධ්‍යයක් වශයෙන් භාවිත කළ හැකි රාශිගත අගයකට ප්‍රවේශ වීමට පහසුකම් සලසා දෙන ගෙවීම් කාඩ්පතක් හෝ වෙනත් යම් උපක්‍රමයක් අදහස් වන අතර, කාඩ්පත නිකුත් කරන්නා වෙත ගෙවීම පිළිබඳ වගකීම් පියවීම සඳහා පමණක් භාවිත කළ හැකි කාඩ්පතක් ඊට ඇතුළත් නොවේ.

## V වන කොටස

### සාමාන්‍ය

**11.** (1) නියම කළ යුතු යැයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනත යටතේ බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයෙහි හෝ එහි නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට හෝ බලාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, එය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ යටතේ යථා පරිදි කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

(4) නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබිය යුතු ය.

**12.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.